# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1970/15 - 2016 ජුනි මස 08 වැනි බදාදා - 2016.06.08

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## ජනාධිපතිතුමාණන් විසින් කරන ලද ප්‍රකාශන ආදිය

ජනා.කා.අංකය : සීඑස්ජී/7/සීඕඅයි/එම්එස්/01.

**ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අතිගරු ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන මැතිතුමන් විසිනි**

මුද්‍රාව

මෛත්‍රීපාල සිරිසේන.

1. ප්‍රීති පද්මන් සූරසේන මැතිතුමා
   අභියාචනාධිකරණ විනිශ්චයකාර
2. කුලතුංග මුදියන්සේලාගේ ගිහාන් හිමාන්ශු කුලතුංග මැතිතුමා
   මහාධිකරණ විනිශ්චයකාර
3. පස්දුන්කෝරලේ ආරච්චිගේ පේමතිලක මැතිතුමා
   විශ්‍රාමික විගණකාධිපති
4. වික්‍රම් අතුල කළුආරච්චි මැතිතුමා
   මහාධිකරණ විනිශ්චයකාර

වෙත,

ශුභාශිංසන පූර්වකවයි !

පරීක්ෂණ කොමිෂන් සභා පනතේ (393 වැනි අධිකාරය) 2 වැනි වගන්තියෙහි විධිවිධාන ප්‍රකාරව වර්ෂ 2015ක් වූ මාර්තු මස 03 වැනි දිනැති අධිකාරි පත්‍රය මගින්, මවිසින් පරීක්ෂණ කොමිෂන් සභාවක් පිහිටුවා ඇති හෙයින් ද,


1A - G 23607 — 17 (2016/06)

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

තවද, එකී පරීක්ෂණ කොමිෂන් සභාවෙහි කොමසාරිස්වරයෙකු වන මහාධිකරණ විනිශ්චයකාර දේශිරි අමේන්ද්‍ර මෙන්ඩිස් සෙනෙවිරත්න මැතිතුමා අභාවප්‍රාප්ත වී ඇති බැවින් ද,

තව ද, එමගින් ඇතිවූ පුරප්පාඩුව පිරවීමේ අවශ්‍යතාවය හඳුනාගනු ලැබ ඇති හෙයින් ද,

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන වන මම, පරීක්ෂණ කොමිෂන් සභා පනතේ 3 වන වගන්තියේ විධිවිධානයන්ට අනුකූලව මහාධිකරණ විනිසුරු පියසේන රණසිංහ මැතිතුමා, එතුමාගේ විචක්ෂණභාවය, සාමාර්ථ්‍ය හා විශ්වාසවන්තභාවය කෙරෙහි මහත්වූ භක්තිය හා විශ්වාසය තබමින්, ඉහත කී අධිකාරී පත්‍රය ප්‍රකාර ස්ථාපනය කරනු ලැබූ පරීක්ෂණ කොමිෂන් සභාවේ කොමසාරිස්වරයෙක් ලෙස මෙයින් පත් කරමි.

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුද්‍රාව යටතේ වර්ෂ දෙදහස් දහසයක් වූ ජූනි මස 01 වැනි දින වූ මෙදින කොළඹ දී දෙන ලදී.

අතිගරු ජනාධිපතිතුමාගේ අණ පරිදි,

පී. බී. අබේකෝන්,
ජනාධිපති ලේකම්.

06 - 757

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.